රටක මහිම - 2

# සිරි දළදා මාලිගාව

දේශමාන්‍ය
සාහිත්‍ය සූරී
සම්මානිත මහාචාර්ය

**ජේ. බී. දිසානායක**

කොළඹ විශ්වවිද්‍යාලය

ඡායාරූප

පණ්ඩුක ද සිල්වා

(C) Sumitha Publishers

**සුමිත පොතක්**

රටක මහිම - 2

# සිරි දළදා මාලිගාව

ප්‍රථම මුද්‍රණය : 2000
සංශෝධිත මුද්‍රණය : 2014

කතෘ :© ජේ. බී. දිසානායක
ඡායාරූප : © පණ්ඩුක ද සිල්වා
සියළු හිමිකම් ඇවිරිනි

ISBN 978-955-696-029-7

ප්‍රකාශනය:

සුමිත ප්‍රකාශකයෝ
info@sumithabooks.com
www.sumithabooks.com
දුරකථනය : 0777809676

මුද්‍රණය:

ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.,
27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.
දුරකථනය : 2716709



## පෙරවදන

ශ්‍රී ලංකාවේ වෙසෙන අපි වාසනාවන්තයෝ. අපට අවුරුදු දෙදාස් ගණනකටත් වැඩි කාලයක සිට පැවත එන සංස්කෘතියක උරුමයක් තියෙනවා. මේ උරුමය අපට ලබා දුන්නේ අපේ රජවරුයි, හාමුදුරුවරුයි, පඬිවරුයි, කලා ශිල්පියොයි, පොදු ජනතාවයි. මේ උරුමය දැන හඳුනා ගෙන, එය මතු පරම්පරාව වෙනුවෙන් රැක බලා ගැනීම අපේ යුතුකමක්.

මේ පොතේ අරමුණ ලංකාව පුරා පිහිටි වටිනා ඓතිහාසික ස්ථාන අතරින් එකක් ඔබට හඳුන්වා දීම. ඔබ මේ ස්ථානයට ආවේ වන්දනාකරුවෙකු හැටියට වුණත්, අධ්‍යාපන චාරිකාවක යෙදෙන්නෙකු හැටියට වුණත් මෙහි ඇති ආගමික වටිනාකම වගේම ඓතිහාසික වටිනාකම හඳුනා ගැනීම ඔබට බාරයි.

මෙය පුංචි පොතක් හින්දා මේ ස්ථානය ගැන හැම තොරතුරක්ම මෙහි ඇතුළත් නොවන්නට පුළුවන්. ඒ වුණත් මේ ස්ථානයේ පූජනීය වටිනාකමත් ඓතිහාසික වටිනාකමත් තේරුම් ගන්ට වුවමනා හැම කරුණක්ම ඇතුළත් කරන්නට අපි වෑයම් කළා. මේ තොරතුරු එක් රැස් කිරීමේදී අපට උදව් උපකාර කළ හැම දෙනාටම අපේ ගෞරවාදර ස්තූතිය පිරිනමනවා.

(C) Sumitha Publishers

මේ පොත මහනුවර පිහිටි 'සිරි දළදා මාලිගාව' ගැන. මේ ස්ථානය වැඳ පුදා ගෙන හෝ දැක බලා ගෙන හෝ ගියාට පස්සේ මේ ස්ථානය පිළිබඳ මතකය නැවත අලුත් කර ගන්නට මෙහි එන ඡායාරූප උපකාර වෙනවා ඇති. ඉතා සිත් ගන්නා ආකාරයට මේ ස්ථානය ඡායාරූපවලට නැගුවේ පණ්ඩුක ද සිල්වා මහතා. ඔහුගේ ඇපකැප වීම මාත් දිරි ගන්වන්නක්. ඡායාරූප සහිත පොතක් පළ කිරීම වියදම් යන වැඩක් වුණත්, මේ විදියේ පොත් පෙළක්ම "රටක මහිම" යනුවෙන් පළ කිරීමේ වගකීම දේශබන්ධු සිරිසුමන ගොඩගේ මහතා භාරගත්තේ පුදුම කැමැත්තකින්. මේ පොත් පෙළේ දෙවෙනි සංස්කරණ පළ කිරීමට බාර ගත්තේ 'සුමිත ප්‍රකාශකයෝ'

මෙහි පරිච්ඡේද 32 ක් ඇතුළත් වෙනවා. බුදුන් වහන්සේට මහා පුරුෂ ලක්ෂණ 32 කුත් දළදා වහන්සේ උදෙසා පැවැත්වෙන බුද්ධ පූජාවට ව්‍යංජන 32 කුත් ඇති නිසා මේ පොත ද පරිච්ඡේද 32 කින් සමන්විත ය.

ඔබ උපන්නේ වටිනා සාරධර්ම පද්ධතියකින් පෝෂණය වුණු සංස්කෘතික සාමාජිකයෙකු හැටියට. මේ වටිනා සංස්කෘතියේ හැඩරුව දැන හඳුනා ගෙන එය මතු පරම්පරාව වෙනුවෙන් රැක බලා ගැනීම ඔබ සතු වගකීමක්. මේ වගකීම නොපිරිහෙලා ඉටු කිරීමට ඔබේ සහයෝගය ලැබෙනු ඇතැයි උදක්ම විශ්වාස කරනවා.

පීටර්ස් පෙදෙස,
නුගේගොඩ

**ජේ. බී. දිසානායක**

# පටුන


| | |
|---|---|
| පෙරවදන | 3 |
| සිරි දළදා මාලිගාව | 5 |
| 01. අපේ බුදුන් අපි වඳින්ට | 6 |
| 02. දළදා වහන්සේ | 8 |
| 03. දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හැටි | 10 |
| 04. දළදා වහන්සේ ප්‍රාතිහාර්ය පෑ වගයි | 12 |
| 05. දළදා විහාරෙ දළදා මාලිගාව වූ සැටි | 14 |
| 06. අනුරාධපුරේ දළදා පෙළහර | 24 |
| 07. දළදා මාලිගාව රැක බලා ගත් රජවරු | 26 |
| 08. දළදා මාලිගාවේ යටි මාලෙ | 30 |
| 09. දළදා මාලිගාවේ හේවිසි මණ්ඩපේ | 32 |
| 10. පල්ලේ මාලේ බුදු ගේ | 36 |
| 11. දළදා මාලිගාවේ උඩු මාලෙ | 38 |
| 12. දළදා කරඬුව | 42 |
| 13. දළදා මාලිගාවේ තේවා කටයුතු | 44 |
| 14. දළදා මාලිගාවේ මංගල්ල | 48 |
| 15. සෙංකඩගල නුවර - ඇසළට කරන පෙරහැර | 52 |
| 16. දළදා මාලිගාවේ නව බුදු මැදුර | 54 |
| 17. දළදා මාලිගාවේ මුළුතැන් ගේ | 56 |
| 18. දළදා මාලිගාවේ අලුත් කටු ගේ | 58 |
| 19. දළදා මාලිගාවේ සිතුවම් | 60 |
| 20. දළදා මාලිගාවේ කැටයම් | 62 |
| 21. තේවා භාර හාමුදුරුවරු | 64 |
| 22. දියවඩන නිලමේතුමා | 66 |
| 23. දළදා මාලිගාවේ මුලාදෑනිවරු | 68 |
| 24. දළදා මාලිගාවෙ කවිකාර මඩුව | 70 |
| 25. දළදා වංශය: කවියෙන් හා සිතුවමෙන් | 72 |
| 26. දළදා සමිඳුන්ගේ ගුණ ගැයූ ගැමි කවියෝ | 76 |
| 27. දළදා මාලිගාවේ සින්දුව | 78 |
| 28. දළදා වතුර කාව්‍යය | 80 |
| 29. 1820 දළදා මාලිගාවෙන් බුදු රැස් විහිදීම | 81 |
| 30. දළදා මාලිගාව අවට ගොඩනැගිලි | 83 |
| 31. දළදා වහන්සේ වඳින ගාථාව | 85 |
| 32. ලෝක බෞද්ධ කෞතුකාරය | 86 |


(C) Sumitha Publishers

# සිරි දළදා මාලිගාව

අපේ රටේ පිහිටි වෙහෙර විහාර අතරින් වටිනා ම සිද්ධස්ථානය හැටියට සැලකෙන්නෙ මහනුවර සිරි දළදා මාලිගාව. බුදුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා අතරින් වටිනා ම ධාතූන් වහන්සේ දළදා වහන්සේ. ඒ නිසා "බුදු හාමුදුරුවො" සිහිපත් කරගෙන දළදාවට "දළදා වහන්සේ" "දළදා හාමුදුරුවො" කියලා කියනවා.

දළදා මාලිගාව වෙනත් සිංහල වෙහෙර විහාරවලට වඩා අමුතු යි. මේ විහාරෙ තමයි "මාලිගාව" යන නමින් හැඳින්වෙන එක ම බෞද්ධ විහාරාරාමෙ නැත්නම් පන්සල. මේකට "දළදා විහාරෙ" නොකියා "දළදා මාලිගාව" කියා කීවේ දළදා වහන්සේත් රජතුමාත් අතර පැවති දේශපාලන සම්බන්ධය නිසා.

හැම පන්සලක ම තියෙනවා වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ කියලා තුන්තරා චෛත්‍යයක්. ඒ වුණත් දළදා මාලිගාවෙ නෑ බෝධීන් වහන්සේ නමක්. බෝධීන් වහන්සේ නමක් නැතත් පාරිභෝගික චෛත්‍යයක් ලෙස සලකන්නට පුළුවන් පාත්‍රා ධාතූන් වහන්සේ මෙහි දාගැබේ නිදන් කරලා තියෙනවා.

දළදා වහන්සේ ලංකාවට වැඩියාට පස්සේ එයින් නියෝජනය වෙන්නේ බුදුන් වහන්සේ විතරක් නෙමෙයි. ලංකාවේ රාජ්‍ය නායකයාට රට පාලනය කරන්නට ඇති අයිතියත් එයින් නියෝජනය වෙනවා. දළදා වහන්සේ රාජ්‍ය බලයේ සංකේතය බවට පත් වුණා. අද වුණත් රාජ්‍ය නායකයා අලුත් පදවියේ වැඩ බාර ගත්තට පස්සේ මුලින් ම යන්නේ දළදා හාමුදුරුවන් වැඳ පුදා ගන්ට. මේ පුංචි පොත මහනුවර සිරි දළදා මාලිගාව ගැන.



# 4.
# දළදා වහන්සේ ප්‍රාතිහාර්ය පෑ වග යි

**ද**ළදා වහන්සේ ලංකාවට වැඩමවන ලද්දේ කාලිංග රටේ ගුහසීව රජතුමාගේ ඉල්ලීම පිට බවයි සාමාන්‍ය පිළිගැනීම. ඒ වුණත් තවත් සමහර පඬිවරුන් කියන්නේ දළදා වහන්සේ ලංකාවට වැඩමෙව්වේ සිංහල රජ්ජුරුවන්ගේ ඉල්ලීම උඩ ය කියායි. ඒ වන විට ලංකාවේ රජකම් කළේ මහසෙන් රජ්ජුරුවො.

දාසයවන සියවසේ දී විතර මහනුවර වල්ගම්පායේ අභයරාජ පිරිවනේ නායක හාමුදුරුවන් ලියපු 'රාජරත්නාකර' නම් ඉතිහාස පොතේ සඳහන් කරලා තියෙන ආකාරයට ගුහසීව රජතුමා දළදා වහන්සේ ලංකාවට වැඩමෙව්වෙ ඒ කාලෙ අනුරාධපුරේ රජ කරපු මහාසේන රජතුමාගේ ඉල්ලීමට.

රාජරත්නාකරයේ මෙහෙම සඳහන් වෙනවා. "මෙම මහසෙන් රජ දඹදිව කලිඟු රට ගුහසීව රජු හා අදෘෂ්ට මිත්‍රව වසනුයේ දළදා වහන්සේ ගෙන එනු පිණිස බොහෝ මුතු මැණික් ආදිය ගුහසීව රජු හට යවා ගමන් කළ කල්හි ඒ ගුහසීව රජතුමාගේ බෑණා වූ දන්ත කුමාරයා හට දළදා වහන්සේ ලංකා ද්වීපයට ගෙන එනු පිණිස භාර කොට දී......"

(රාජරත්නාකරය : සංස්කරණය - පූජ්‍ය දවුල්දෙණ ඥාණිස්සර හිමි හා ස.ජ. සුමනසේකර බණ්ඩා, (1994) 22 පිට).

දළදා වහන්සේ ලංකාවට වැඩම කරන්ට කියලා ඉල්ලා සිටියේ මහසෙන් රජතුමා වුණත් දන්ත කුමාරයයි හේමමාලා කුමාරියයි උන් වහන්සේ ලංකාවට වැඩමවන කොට මහසෙන් රජතුමා අභාවප්‍රාප්ත වෙලා. ඒ වන කොට සිහසුනට පත් වෙලා හිටියෙ එතුමාගේ පුත් කුමාරයා.

'කීර්ති ශ්‍රී මේඝ වර්ණ' නැත්නම් 'කිත් සිරි මෙවන්' නමින් හැඳින්වුණු මේ රජ්ජුරුවො සිංහාසනාරූඪ වෙලා අවුරුදු නවයක් ගිය තැනේදීයි දළදා වහන්සේ ලංකාවට වැඩියෙ.

මේ ප්‍රවෘත්තිය 'මහාවංස' නම් පාලි පොතේ මෙහෙම විස්තර කරලා තියෙනවා. "ඒ සිරි මෙවන් රජු රාජ්‍යයට පැමිණි නවවන හවුරුද්දෙහි බැමිණියක් තොමෝ මහර්ෂීන්ගේ (බුදුන්ගේ) දළදාව (දඹදිව) කලිඟු රටින් මෙහි ගෙන ආය. හෙළු දළදා වංශයෙහි කියූ පරිද්දෙන් රජතෙම ඒ දාඨා ධාතුව බහුමාන පුරඃසරව පිළිගෙන උතුම් පූජා පවත්වා හුදු ස්ඵටික මාණික්‍ය කරඬුවෙක බහා තමා දෙවනපෑතිස් නරේන්ද්‍රයන් විසින් රාජාරාමයෙහි කරවන ලද ධර්මචක්‍ර නම් ගෘහයට වැඩමවූ සේයි. එවක් පටන් ඒ ගෙය දාඨාධාතුඝර නම් විය." (සිංහල මහාවංශය, ඩී. එම්. ඇස්. අභයරත්න පරිවර්තනය, 1922, 151 පිට)

'රාජරත්නාකරයේ' සඳහන් ආකාරයට කිත්සිරි මෙවන් රජතුමාගෙ අතට දළදා වහන්සේ පත් වුණාම එතුමාගේ හිතේ තරමක සැකයක් ඇති වුණා ලු මේ සැබෑ දළදා වහන්සේම ද කියලා. මොකද, රජතුමා



(C) Sumitha Publishers

අහලා තිබුණේ බුදුන් වහන්සේගේ දළදා වහන්සේ සුදු පාටයි කියලා. දළදාව රෙදි කඩ කීපයකින් වසා ගෙන ඇවිත් තිබුණු හින්දායි මෙහෙම සැකයක් හිතේ උපන්නෙ.

රජතුමාගෙ සිතේ මේ සැකය උපදින කොට ම දළදා වහන්සේ ප්‍රාතිහාර්ය පාන්ට පටන් ගත්තා කියලා රාජරත්නාකරයේ කියවෙනවා:

"ඒ රජ දළදා වහන්සේ දැක බුදුන්ගේ දළදා ශුභ්‍ර වර්ණයයි ඇසීමියි සැක සිතා සියයක් පමණ වස්තු පටලයෙන් වසා සිටි කල්හි දළදා වහන්සේ:

තස්මිං ඛණෙ සො ජිනදන්තධාතු
නභං සමුග්ගම්ම පභාසයන්තො
සබ්බා දිසා ඕසධිතාරකාව
ජනං පසාදේසි විතිණ්ණකඞ්කං

මෙසේ ප්‍රාතිහාර්ය දැක්වූ කල්හි ප්‍රාතිහාර්ය යෙහි පැහැද මුළු ලක්දිව දළදා වහන්සේට පුදා අනිකුදු බොහෝ සත්කාර කොට පරලොව ගිය පසු......" (රාජරත්නාකරය, 23 පිට).

වංශ කථාවල සඳහන් වන ආකාරයට, දළදා වහන්සේ මුලින් ම තැන්පත් කළේ 'ධර්මචක්‍ර' නැත්නම් 'ධම්මචක්ක' නම් මන්දිරයේ. මේ ගොඩනැගිල්ලට 'ධම්මචක්කගෙහ' යන නම ලැබුණේ මොන හේතුවක් නිසා ද යන්න හරියට ම පැහැදිලි නෑ. මෙය ඉදි කළේ දෙවනපෑතිස් රජතුමා නිසා ඒක මහින්ද මහ රහතන් වහන්සේ සිහිපත් වෙන්ට කළ ගොඩනැගිල්ලක් වන්ට පුළුවන්.

මිහිඳු හාමුදුරුවො අනුරාධපුරයෙ දි 'ධම්මචක්කපවත්තන' සූත්‍රය දේශනා කළා. ඒ දේශනාව පැවැත්තුවෙ මේ මන්දිරයෙ වෙන්ට ඇති. ඒ නිසා මේ මන්දිරයට ඒ නම ලැබෙන්ට ඇති. දළදා වහන්සේ එහි තැන්පත් කළ නිසා ඒ නම වෙනුවට 'දාඨාධාතුඝර' නැත්නම් 'දළදා ගේ' යන නම පසු කලක දී ව්‍යවහාරයට ආවා.





වැඩ සිටින මාලිගාව



(C) Sumitha Publishers



වැඩ සිටින මාලිගාවේ යටි මාලේ පිහිටි දිග් ගේ හා අරමුදල රන් සිවි ගේ



පල්ලෙ මාලෙ බුදු ගෙයි දොරටුව



(C) Sumitha Publishers



පල්ලෙ මාලෙ බුදු ගේ



පත්තිරිප්පුව





පත්තිරිප්පුව ඇතුළේ තැන්පත් කොට ඇති බුදු පිළිමය හා කරඬුව



(C) Sumitha Publishers

# 6.
# අනුරාධපුරේ දළදා පෙළහර

වංශ කථාවල කියවෙන විදියට කිත්සිරි මෙවන් රජතුමා දළදා වහන්සේ පෑ පෙළහර දැකලා පැහැදිලා මුළු ලංකාදීපය ම උන් වහන්සේට පූජා කළා. දළදා වහන්සෙ මුලින් ම තැන්පත් කළේ 'ධම්ම චක්ක ගේහ' නම් ගොඩනැගිල්ලෙ. එය පිහිටා තිබුණෙ 'රාජාරාම' නම් විහාරයෙ. ඒක හැදුවෙ දේවානම්පියතිස්ස රජතුමා.

ලංකාවෙ මුල් ම දළදා විහාරෙ හැටියට සලකන්ට පුළුවන් මේ මන්දිරය යි. දළදා වහන්සේ තැන්පත් කරලා තිබුණු හින්දා ඒකේ නමත් වෙනස් වුණා 'දාඨා ධාතු ඝර' කියලා. පාලි භාෂාවෙන් ඒ නම යෙදුණෙ 'දළ දා ගේ' කියන තේරුමෙන්.

කිත්සිරි මෙවන් රජතුමා දළදා වහන්සේට නොයෙකුත් පුද පූජා පැවැත්තුවා. එතුමා නව ලක්ෂයක් ධනය වියදම් කරලා දළදා පෙරහැරක් පැවැත්වූ බව මහාවංශයෙහි සඳහන් වෙනවා. දළදා වහන්සේ දළදා ගෙයි සිට අභයගිරි විහාරෙට වැඩමවා ගෙන ගිහින් තමයි මේ දළදා පෙරහැර පැවැත්තුවෙ.

අනුරාධපුරේ දළදා ගේ ගැනත් දළදා පෙරහැර ගැනත් ඔය කාලෙ අනුරාධපුරයට ආපු ෆාහියන් කියන චීන හාමුදුරුවො හොඳ විස්තරයක් කරලා තියෙනවා. ක්‍රිස්තු වර්ෂ 414 දී ලංකාවට ආපු මේ චීන හාමුදුරුවො, අනුරාධපුරේ අවුරුදු කීපයක් ගත කරලා එහිදී තමා ඇසූ දුටු දේවල් තමාගේ ගමන් විස්තරේ ඇතුළත් කළා.



දළදා පෙරහැර (ඡායාරූපය දළදා මාලිගාවේ මාධ්‍ය ඒකකය)

'පාහියන්ගේ දේශාටන වාර්තාවේ' සඳහන් වන විදියට 'දළදා ගේ' සත් රුවනින් ඉදි කරපු මන්දිරයක්. අනුරාධපුරය ගැන එතුමා මෙසේ කියනවා:

"බුදුන් වහන්සේගේ දළදාව තැන්පත් කොට තිබෙන මන්දිරයද මේ නගරයෙහිම වෙයි. මේ දන්ත ධාතු මන්දිරය මුළුමනින්ම නිමවා ඇත්තේ සත් රුවනිනි" (මහාචාර්ය බලගල්ලේගේ පරිවර්තනය, 1960, 112 පිට).

දළදා පෙරහැර කාලයේ දී පවත්තපු දන්ත ධාතු ප්‍රදර්ශනයක් ගැනත් මේ ගමන් වාර්තාවේ සඳහන් වෙනවා තරමක් විස්තර ඇතුව:

සිරිත් පරිදි දළදා ප්‍රදර්ශනය පවත්තන්නෙ තුන්වෙනි මාසෙ මැදදි. ඒ ප්‍රදර්ශනේ ආරම්භ කරන්ට දවස් දහයකට කලින් රජතුමා ලොකු ඇතෙක් නොයෙකුත් ඇඳුම් පැළඳුම්වලින් සරසනවා. ඊට පසුව රාජකීය සළු පිළියෙන් සැරසුණු දක්ෂ කථිකයෙක් ඇතා පිටට නංවනවා. මඟුල් බෙර ගහලා සෙනඟ රැස් වුණාම ඔහු මෙහෙම කියනවා:

"බලන්න පින්වතුනි, අද ඉඳලා දවස් දහයක් ගිය තැනේදි බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ පිටතට ගෙනල්ලා අභයගිරි විහාරෙට වැඩම කරවනවා. පින් රැස් කර ගන්ට කැමති ගිහි පැවිදි සියල්ලෝම මඟ මාවත් සමර කරත්වා! නගරයේ ලොකු කුඩා පාරවල් සරසත්වා! හැම හැම ආකාරයකම සුවඳ දුම් මල් ආදී පූජා වස්තු පිළියෙල කරත්වා!

"ඇතා පිට ඉඳලා මේ ප්‍රකාශය කළාට පස්සෙ රජතුමා මහ පාර දෙපැත්තේ ජාතක සිතුවම් ප්‍රදර්ශනය කරන්ට පිළියෙල කරනවා. මේ සිතුවම්වලින් කියවෙන්නේ බුදුන් වහන්සේගේ පන්සිය පනස් ජාතකවලට අයිති කතා. 'සුදාන ජාතකය' 'සාම ජාතකය' වගේ ජාතක කතා. හොඳ ලස්සන පාටින් ඇඳපු මේ සිත්තම් ඉතාම සිත් ගන්නා ඒවා.

"ඊට පස්සේ දළදා වහන්සේ දළදා මන්දිරයෙන් පිටතට වඩම්මාගෙන ඇවිත් ප්‍රධාන මාර්ගය දිගේ අභයගිරි විහාරෙට වඩම්මාගෙන යනවා. එතන තියෙනවා ප්‍රදර්ශන ශාලාවක්. දළදා වහන්සේ මේ ප්‍රදර්ශන ශාලාවට ළඟා වන තෙක්ම මිනිස්සු පාර දිගට පූජා පවත්වනවා. ඊට පස්සෙ මහා සංඝයා වහන්සේලායි ගිහියොයි එක් රැස් වෙලා සුවඳ දුම්, පහන් ආදියෙන් පුද පූජා පවත්වනවා රෑ දාවල් දෙකේම නැවතීමක් නැතුව.

"ඔය විදියකට අනූ දවසක් ගියාට පස්සෙ දළදා වහන්සේ ආපහු දළදා මන්දිරයට වඩමවනවා. සැදැහැවතුන්ට දළදා වහන්සේ වැඳ පුදා ගන්ට පුළුවන් වන විදියට මේ දළදා මන්දිරය පෝයදාට විවෘත කරලා තියෙනවා."

කුරුණෑගල යුගයේදී ලියවුණු 'දළදා සිරිත' නම් පොතේ සඳහන් වන ආකාරයට, හේමමාලා කුමාරියත් දන්ත කුමාරයාත් අනුරාධපුරයට ඇවිත් කිත්සිරි මෙවන් රජතුමාට දළදා වහන්සේ භාර දෙන්ට කලින් උන් වහන්සේ තැන්පත් කරලා තිබුණෙ "මහමෙවුනා උයන් මැද නේ සසිරි සිරිමත් මේගිරි වෙහෙරෙහි" යි.

'මේගිරි වෙහෙර' කියා කීවේ ඉසුරුමුනි විහාරෙට කියලා මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා අනුමාන කරනවා. කිත්සිරි මෙවන් රජතුමා මේගිරි වෙහෙරට ඇවිත් "පූජා සත්කාර කෙරෙමින් දළදා කරඬුව සිය මුදුනෙනුසුලා මනාව සරහා පිළියෙල කරන ලද සසිරිමත් සේසතින් වොරදනා රථ යානාවකට පැන නැගී ගොස්, සව් සිරින් සුර පුරෙව් පවර අනුරපුර වැද" දළදා වහන්සේ සිහසුන් යහන්හි තැන්පත් කළ බව දළදා සිරිතේ කියවෙනවා. (දළදා සිරිත, වජිරා රත්නසූරිය සංස්කරණය, 38 පිට)

(C) Sumitha Publishers